**රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ විධායක සේවා ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය**

01. සම්බන්ධ වන ආයතන :

1.1 දෙපාර්තමේන්තුව : රාජ්‍ය ව්‍යාපාර

යොමු අංකය : PED/Ad/2/17

දිනය : 2022.06.05

1.2 අමාත්‍යාංශය : මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

යොමු අංකය : MF1/01/03/AD/Departmental

දිනය : 2022.08.10

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම

යොමු අංකය : DMS/1172/Vol.I

දිනය : 2021.09.23

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය

යොමු අංකය : EST-2/04/REC/10202

දිනය : 2022.06.15

1.5 ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය

යොමු අංකය : NPC/03/02/06/SR

දිනය : 2022.04.29

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය

යොමු අංකය : PSC/EST/09-01-02/03/2022

දිනය : 2022.12.09

02. පත්කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

03. සේවා ගණය පිළිබඳ විස්තර :

3.1 සේවා ගණය : විධායක

3.2 ශ්‍රේණි : III, II හා I

3.3 පැවරෙන කාර්යය භාරය පිළිබඳ පොදු නිර්වචනය : පොදු ස්වභාවය අනුව ප්‍රතිපත්ති සම්පාදනය ,විධානය/අණදීම, කළමනාකරණය හා ඒ සම්බන්ධ තීරණ ගැනීම යන කාර්යයන්ට ඇතුළත් වු ද ආයතනයේ ඉහළම විධායක නිලධාරියාට පැවරෙන සමස්ත කාර්ය භාරයේ අන්තර්ගත කාර්යයන් අතරින් තනතුර නිශ්චිත කොට පවරාදෙනු ලබන කාර්යයන් පැවරෙන සේවා ගණයකි.

3.4 කාර්යයන් පැවරිම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධාරියකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැකිය.

04 තනතුරෙහි/තනතුරුවල ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.)

05 වැටුප් :

5.1 වැටුප් කේත අංකය : SL 0 1-2016

5.2 වැටුප් පරිමාණය : 47,615 - 10 x 1,335 – 8 x 1,630 – 17 x 2,170 – 110,895/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාල ආරම්භක වැටුප් පියවර:

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | පියවර 01 | 47,615/- |
| II | පියවර 12 | 62,595/- |
| I | පියවර 20 | 76,175/- |

වැටුප් ගෙවීම සහ සෙසු කරුණු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධානයන්ට අනුකූල විය යුතුය.

06. සේවා ගණයට අයත් තනතුර/තනතුරු :

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ | III/II | 01 | තමාගේ අංශයේ කටයුතු පිළිබඳ තීරණයන්ට එළඹීමට සහාය වීම හා ඒ සම්බන්ධව අධ්‍යක්ෂ ජනරාල්ට හා අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ට වගකීම, අංශයේ කාර්ය මණ්ඩලය අධීක්ෂණය කිරීම |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : සහකාර අධ්‍යක්ෂ /නියෝජ්‍ය අධ්‍යක්ෂ 01

“ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III,II,I ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.”

7. බඳවා ගැනීමේ ක්‍රමය :

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | - |
| සීමිත | 100% |
| කුසලතා | - |

7.2 විවෘත බඳවා ගැනීම : අදාළ නොවේ

7.3 සීමිත බඳවා ගැනීම

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.3.2 සුදුසුකම්

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් : විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පන්ති සාමර්ථයක් සහිත ආර්ථික විද්‍යාව, මූල්‍ය කළමනාකරණය හෝ එම විෂයයන්ට අදාළ විෂයයන් අවම වශයෙන් 60% ක් ඇතුළත් උපාධියක් ලබා තිබීම.

7.3.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ

7.3.2.3 පළපුරුද්ද : රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ MN – 6 වැටුප් පරිමාණයේ මූල්‍ය විශ්ලේෂක තනතුරේ අවම වශයෙන් වසර දහයක (10) සතුටු දායක හා සක්‍රීය සේවා කාලයක් සපුරා තිබීම.

7.3.2.4. කායික සුදුසුකම් : ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.

7.3.2.5 වෙනත් :

I තනතුරේ ස්ථිර කර තිබිය යුතුය

II අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත වීම

III තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.3.3 වයස

7.3.3.1 අවම සීමාව : අවු. 21 ට නොඅඩු

7.3.3.2 උපරිම සීමාව : අදාළ නොවේ

7.3.4 බඳවා ගැනීමෙ ක්‍රමය : ලිඛිත පරීක්ෂණයක හා යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

7.3.4.1 ලිඛිත විභාගය : විෂය නිර්දේශය ඇමුණුම 01 හි අමුණා ඇත.

7.3.4.1.1 පවත්වන බලධරයා: රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක් මඟින්

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය: අදාළ නොවේ

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය: අදාළ නොවේ

7.3.4.4 යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී අධ්‍යක්ෂ තනතුරට පැවරෙන කාර්යයන්ට අදාළව දෙනු ලබන මාතෘකාවක් ඔස්සේ කරනු ලබන ඉදිරිපත් කිරීමක් සහ ඒ සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් විමසනු ලබන ප්‍රශ්න අනුව පහත සඳහන් ශීර්ෂයන් යටතේ ලකුණු 20 ක් සහ අතිරේක අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් යටතේ ලකුණු 10 ක් ලබා දෙනු ලැබේ.

| ඉදිරිපත් කිරීම සඳහා ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| කළමනාකරණ කුසලතා | 5 |
| භාෂා හැකියාව | 5 |
| සන්නිවේදන කුසලතා | 5 |
| නායකත්ව කුසලතා | 5 |

සටහන :

1. ලිඛිත පරීක්ෂණයේදී ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

2. සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතුරින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලබාගන්නා ලකුණුවල සහ ලිඛිත පරීක්ෂණයේ ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

7.3.4.4.1 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : ප්‍රසිද්ධ දැන්වීමක් හෝ අභ්‍යන්තර නිවේදනයක් මඟින් හා වෙබ් අඩවියේ දැන්වීම පළ කිරීම මඟින්

8. කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය - ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| පළමු කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම 2 පරිදි) |
| දෙවන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී වසර තුනක් (3) ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයක් හෝ දෙපාර්තමේන්තුව විසින් තීරණය කරනු ලබන ලිඛිත ඇගයීමක් (ඇමුණුම 3 පරිදි) |
| තුන්වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර පහක් (5) ගතවීමට පෙර | දෙපාර්තමේන්තුව විසින් තීරණය කරන ලද ලිඛිත ඇගයීමකින් (ඇමුණුම 4 පරිදි) |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වසරකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාල පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද :

| | |
|---|---|
| පළමු කාර්යක්ෂමතා කඩඉම<br>දෙවන කාර්යක්ෂමතා කඩඉම<br>තුන්වන කාර්යක්ෂමතා කඩඉම | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මඟින් |

9. භාෂා ප්‍රවීනතාව

9.1

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 1. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබාගත යුතුය. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

10. ශ්‍රේණි උසස් කිරීම

10.1 111 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය කාර්යසාධනය අනුව

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

i පත්වීම ස්ථිර කර තිබීම.

ii සේවා ගණයේ 111 ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක් (10) ක් උපයාගෙන තිබීම.

iii අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව **උසස්කිරීමේ** දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

v අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

vi අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි 11 ශ්‍රේණියට උසස් කිරීම් පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.2 11 වන ශ්‍රේණියේ සිට 1වන ශ්‍රේණියට උසස් කිරීම

10.2.1 සාමාන්‍ය කාර්යසාධනය අනුව

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

i විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත ආයතනයක රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද ව්‍යාපාර කළමනාකරණය, රාජ්‍ය ප්‍රතිපත්ති, ආර්ථික විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයන්ට අදාලව හෝ ඒ හා සමාන ක්ෂේත්‍රයක ශාස්ත්‍රපති හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

ii සේවා ගණයේ 11 ශ්‍රේණියේ වසර හතක (07)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම හා නියමිත වැටුප් වර්ධක හතක් (07) ක් උපයාගෙන තිබීම.

iii රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

Iv අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වු වසර (07) තුළම සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

v අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදුකරනු ලැබේ.

සංලක්ෂය: සාමාන්‍ය මට්ටමේ කාර්යසාධනය <u>අනුව උසස් කිරීමේදී නියමිත දිනට</u> කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

11. තනතුරු වලට පත් කිරීම්: අදාළ නොවේ

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි : අදාළ නොවේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපනවලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපන

**සක්‍රිය සේවා කාලය** යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුලත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රිය සේවා කාලයක් ලෙස සැළකිය යුතුයැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන්ද ඇතුළත් , නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය : අදාළ නොවේ

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්යය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන ඇතුළත් වේ.

16. "මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වේතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ."

17. අන්තර්කාලීන විධිවිධාන : අදාළ නොවේ

සකස් කළේ

නම :- I. ට දේවගේ

තනතුර :- ක. සේ. නි

දිනය :- 2023/02/20

පරීක්ෂා කළේ

ආර්. ජේ. ආබේදීර
අධ්‍යක්ෂ
රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය

නම :-

තනතුර :-

දිනය :- 20/02/2023

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

අත්සන :-

නම :- ජී. ඒ. සුසන්ත අතුල කුමාර

අධ්‍යක්ෂ ජනරාල්

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

මහා භාණ්ඩාගාරය

කොළඹ 01.

නිල මුද්‍රාව :-

දිනය :- 20/02/2023

යොමු අංකය - MF/01/03/AD/Departmental

2022-12-09 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා වන යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කරමි.

අත්සන :-

නම :-

නිල මුද්‍රාව :-

දිනය :- 24/03/2023

කේ.එම්.එම්. සිරිවර්ධන

මහා භාණ්ඩාගාරයේ සහ මුදල්,ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්

මුදල් අමාත්‍යාංශය

කොළඹ 01.

යොමු අංකය :- PSC/EST/09-01-02/03/2022

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය 2022.12.09 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන :-

නම :- තනුජා මුරුගේෂන්

නිලමුද්‍රාව :-

දිනය :- 2023.03.17

තනූජා මුරුගේෂන්

වැඩ බලන ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

අංක. 1200/9, රජමල්වත්ත පාර,

බත්තරමුල්ල

ඇමුණුම 01

01. විභාගයේ නම : රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය ( දෙපාර්තමේන්තුගත) සඳහා බඳවා ගැනීමේ සීමිත විභාගය

02. විභාගය පිළිබඳ විස්තර :

| විෂයයන් | කාලය (පැය) | ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1.සාර්ව ආර්ථික ප්‍රතිපත්ති හා මෑත කාලීන ආර්ථික ප්‍රවණතා | 03 | 100 | 50 |
| 11. මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණය | 02 | 100 | 50 |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

04. විභාගය සඳහා විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය සහ ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය |
|---|---|
| 1. සාර්ව ආර්ථික ප්‍රතිපත්ති හා මෑත කාලීන ආර්ථික ප්‍රවණතා | සාර්ව ආර්ථික ප්‍රතිපත්ති හා බැඳුණු මූලික සිද්ධාන්ත හා මෑතකාලීන ආර්ථික ප්‍රවණතා ශ්‍රී ලංකාවට අදාළ වන ආකාරය හා බැඳුණු ව්‍යුහගත ප්‍රශ්නවලින් සැකසුණු ප්‍රශ්න පත්‍රයකි. |
| 11. මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණය | දෙනු ලබන මූල්‍ය ප්‍රකාශනයන් විශ්ලේෂණය මඟින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම හා මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණය හා බැඳුණු සිද්ධාන්ත පිළිබඳ බහුවරණ හා ව්‍යුහගත ප්‍රශ්නවලින් සමන්විත වේ. |

සකස් කළේ :-

අත්සන :-
නම :- I.U දේවගේ
තනතුර :- ක.සේ.නි
දිනය :- 2023/02/20

පරීක්ෂා කළේ :-

අත්සන :
නම :- ආර්.ජේ. ආබිදීන්
තනතුර :- අධ්‍යක්ෂ, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය
දිනය :- 20/02/2023

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන :-
දෙපාර්තමේන්තු ප්‍රධානියා
නම :-
තනතුර :-
නිල මුද්‍රාව :-

පී. ඒ. සුසන්ත අතුල කුමාර
අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

ඇමුණුම 02

01. විභාගයේ නම : රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය ( දෙපාර්තමේන්තුගත) සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02. විභාගය පිළිබඳ විස්තර :

| විෂයයන් | කාලය (පැය) | ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1.යහපාලනය සම්බන්ධ මාර්ගෝපදේශ සංග්‍රහය | 03 | 100 | 40 |
| 11. ක්‍රමෝපිත කළමණාකරණය | 01 | 100 | 40 |
| 111.කළමනාකරණ අභියෝගයතාව | 02 | 100 | 40 |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය සහ ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය |
|---|---|
| යහපාලනය සම්බන්ධ මාර්ගෝපදේශ සංග්‍රහය | 2021 වසරේදී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 01 සිට 05 දක්වා පරිච්ඡේද සහ ඊට අදාළ මෙහෙයුම් අත්පොත පිළිබඳ ව්‍යූහගත රචනා ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. |
| ක්‍රමෝපිත කළමනාකරණය | ක්‍රමෝපිත කළමනාකරණය සම්බන්ධ මූලික සිද්ධාන්ත සහ රාජ්‍ය ව්‍යාපාර අධීක්ෂණයේදී ඒවායේ භාවිතයන් සම්බන්ධයෙන් සැකසුණු බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. |
| කළමනාකරණ අභියෝගයතාව | රාජ්‍ය ව්‍යාපාර සම්බන්ධ ගැටළු හඳුනා ගැනීම, අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීම, සන්නිවේදන කුසලතාවය, ස්වයං විනය ප්‍රතිපත්ති හා උපායමාර්ග සකස් කිරීම සහ භාවමය බුද්ධිය යනාදී වශයෙන් අපේක්ෂකයාට යොමු කරනු ලබනසිද්ධි හා ප්‍රස්තාවන් අනුසාරයෙන් අපේක්ෂකයා සතු කුසලතාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. |

සකස් කළේ :-

අත්සන :- [signature]

නම :- I. U දේවගේ

තනතුර :- ක. සේ. නි

දිනය :- 2023/02/20

පරීක්ෂා කළේ :-

අත්සන

නම

තනතුර

දිනය :- 20/02/2023

ආර්.ජේ. ආබිදීන්
අධ්‍යක්ෂ
රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන :-

දෙපාර්තමේන්තු ප්‍රධානියා

නම :-

තනතුර :-

නිල මුද්‍රාව :-

පී. ඒ. සුසන්ත අතුල කුමාර
අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

ඇමුණුම 03

01. විභාගයේ නම : රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය (දෙපාර්තමේන්තුගත) සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02. විභාගය පිළිබඳ විස්තර :

| විෂයයන් | කාලය (පැය) | ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1 ආයතන සංග්‍රහය | 02 | 100 | 40 |
| 11. මුදල් රෙගුලාසි | 02 | 100 | 40 |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය සහ ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය |
|---|---|
| ආයතන සංග්‍රහය | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ I සහ II කාණ්ඩ |
| මුදල් රෙගුලාසි | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය |

සකස් කළේ :-

අත්සන :-

නම :- I.U දේවගේ

තනතුර :- ක.සේ.නි

දිනය :- 2023/02/20

පරීක්ෂා කළේ :-

අත්සන :-

නම :- ආර්.ජේ. ආබිදීන

තනතුර :- අධ්‍යක්ෂ, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය

දිනය :- 20/02/2023

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන :-

දෙපාර්තමේන්තු ප්‍රධානියා

නම :- ජී. ඒ. සුසන්ත අතුල කුමාර

තනතුර :- අධ්‍යක්ෂ ජනරාල්

නිල මුද්‍රාව :- රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය, කොළඹ 01.

ඇමුණුම 04

01. විභාගයේ නම : රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය ( දෙපාර්තමේන්තුගත) සඳහා වන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02. විභාගය පිළිබඳ විස්තර :

| විෂයන් | අධීක්ෂණය | සමත්/අසමත් බව |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ කාර්යයභාරයට අදාළ පර්යේෂණ නිබන්ධනයක් හෝ වෙනත් එවැනි වාර්තාවක් ඉදිරිපත් කිරීම. | පත්වීම් බලධාරියා විසින් නියම කරනු ලැබූ ආයතනය විසින් අධීක්ෂණය කිරීම. | සාර්ථකව අවසන් කළ බවට ලබන සහතික පත්‍රය |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

සකස් කළේ :-

අත්සන :- [signature]

නම :- I.O දේවගේ

තනතුර :- රා.සේ.නි

දිනය :- 2023/02/20

පරීක්ෂා කළේ :- [signature]

අත්සන :-

නම

තනතුර

දිනය

ආර්.ජේ. ආබිදීන්
අධ්‍යක්ෂ
රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය

20/02/2023

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන :- [signature]

දෙපාර්තමේන්තු ප්‍රධානියා

නම :-

තනතුර :-

නිල මුද්‍රාව :-

පී. ඒ. සුසන්ත අතුල කුමාර
අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.